# Year 2023’ Dormant Insurance

## කොරියාවේ සේවය කල කාලය තුල හිමි රක්ෂණ මුදල් සම්බන්ධ නිවේදනයයි`

(ත්වෙජිකුම් / 퇴직금 සහ මව් රටට යාමේදී ගුවන් ටිකට්පත් මිලදී ගැනීමට අදාලව / 귀국비용보험)

ශ්‍රී ලංකාව හා දකුණු කොරියානු ජනරජය අතර ක්‍රියාත්මක වන අවබෝධතා ගිවිසුම් ප්‍රකාරව ඔබ එරට සේවය කරන ලද සේවා කාලයේදී ඔබගේ වැටුපෙන් අඩු කරගත් රක්ෂණ වාරික මත හිමිකම් ලබන ප්‍රතිලාභ (ත්වෙජිකුම්) සහ මව් රටට යාමේදී මිලදීගත් ගුවන් ටිකට්පත් සඳහා වැය වූ වියදම් පියවා ගැනීමට අදාළ මුදල් ලබා ගැනීම සඳහා පහත දක්වා ඇති පරිදි නියමිත ලියකියවිලි සමග මෙහි දක්වා ඇති විද්‍යුත් තැපැල් ලිපිනය ඔස්සේ අයදුම් කල හැක.

- ❖ රක්ෂණ මුදල් සදහා අයදුම් කිරීමට ඔබගේ නම මේ සමග අමුණා ඇති ලැයිස්තුවෙහි ඇතුළත්ව ඇත්දැයි ප්‍රථමයෙන් පරීක්ෂා කරන්න.
- ❖ එම ලැයිස්තුවෙහි නම ඇතුළත් වුවද, ඔබ මේ වනවිටත් මෙම රක්ෂණ මුදල් ලබාගෙන හෝ රක්ෂණ මුදල් ලබාගැනීම සඳහා අයදුම්පත් යොමුකර ඇත්නම්, නැවත ගෙවීමක් හෝ අයදුම්පත් යොමුකිරීමක් සිදුකරනු නොලැබේ.
- ❖ විද්‍යුත් තැපැල් ලිපිනය * **epscenterlk@yahoo.com**
- ❖ ඔබ සම්පූර්ණ කරන ලද අයදුම්පත අප වෙත යොමු කරන විට විද්‍යුත් තැපෑලෙහි මාතෘකාව **(Subject)** - **“Dormant Insurance** - අයදුම්කරුගේ නම” ලෙස සඳහන් කරන්න
- ❖ රක්ෂණ මුදල් සඳහා අයදුම් කිරීමේ සියලු කටයුතු විද්‍යුත් තැපැල් මාර්ගයෙන් පමණක් සිදුවන බව කරුණාවෙන් සලකන්න.
- ❖ ඔබ විසින් අයදුම්පත නිවැරදිව පිරවිය යුතු අතර දෝෂ සහිත අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප

දැනට දකුණු කොරියාවේ සේවය නිමකොට පැමිණි සේවක මහත්ම/මහත්මීන් විසින් ඉල්ලුම් කරන්නේ නම්,

1. සම්පූර්ණ කරන ලද රක්ෂණ අයදුම්පතෙහි ස්කෑන් පිටපතක් (රක්ෂණ අයදුම්පත සහ එය පිරවිය යුතු ආකාරය දැක්වෙන ආදර්ශ අයදුම්පත මේ සමග අමුණා ඇත).
2. ගුවන් ගමන් බලපත්‍රයේ පළමු පිටුවෙහි ස්කෑන් පිටපතක් (ඡායාරූපය සහිතව)
3. ජාතික හැඳුනුම්පතෙහි ස්කෑන් පිටපතක් (Scan ID)
4. කොරියාවෙන් පිටවූ බවට වූ ආගමන විගමන මුද්‍රාව ස්කෑන් පිටපතක් (Departure Seal)
5. ලංකාවේ සක්‍රීය බැංකු ගිණුමක පිටපතක් ස්කෑන් පිටපතක් (මෙහිදී බැංකුවේ නම, ශාඛාවල ගිණුම් අංකය හා ගිණුම් හිමියාගේ නම සඳහන් විය යුතුය. [එසේම බැංකුවට අදාල Swift Code අයදුම්පතෙහි සදහන් කල යුතුය.] එසේම ගුවන් ගමන් බලපත්‍රයේ සදහන් නම හා බැංකු ගිණුමේ නම සමාන විය යුතුය (පහත සදහන් උදාහරණ පරිදි).

දැනට වෙනත් විදේශීය රටක සිටින කොරියාවේ සේවය කර එරටින් පිටවූ අයකුගේ නියෝජිතයෙකු ඉල්ලුම් කරන්නේ නම්,

1. සම්පූර්ණ කරන ලද රක්ෂණ අයදුම්පතෙහි ස්කෑන් පිටපතක් (රක්ෂණ අයදුම්පත සහ එය පිරවිය යුතු ආකාරය දැක්වෙන ආදර්ශ අයදුම්පත මේ සමග අමුණා ඇත)
2. ගුවන් ගමන් බලපත්‍රයේ පිටපතක් (ඡායාරූපය සහිතව) - රක්ෂණ හිමිකරුගේ
3. රක්ෂණ හිමිකරු කොරියාවෙන් පිටවූ බවට වූ ගුවන් ගමන් බලපත්‍රයේ ආගමන විගමන මුද්‍රාව ස්කෑන් පිටපතක් (Departure Seal)
4. රක්ෂණ හිමිකරු තම අත් අකුරින් ලියන ලද ඔහුගේ/ඇයගේ දුරකථන අංකය සහිත බලය පැවරූ ලිපියක් ඉංග්‍රීසි භාෂාවෙන් (ඔහු/ ඇය සිටින රටෙහි තානාපති කාර්යාලය විසින් සහතික කරන ලද),
5. බලය පැවරූ නියෝජිතයාගේ ඥාති සබඳතාවය පෙන්නුම් කලහැකි උප්පැන්න සහතිකය/විවාහ සහතිකය (දිවුරුම් පරිවර්තක මගින් ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කර එහි පිටපතක් සමගින්)
6. ඔහුගේ/ඇයගේ සක්‍රීය බැංකු ගිණුමක පිටපතක් - බලය පැවරූ නියෝජිතයාගේ
7. ගුවන් ගමන් බලපත්‍රයේ හෝ ජාතික හැඳුනුම්පතේ පිටපතක් - බලය පැවරූ නියෝජිතයාගේ

1. ඉහත සියලු ලේඛන නීතිඥයකු ලවා සහතික කිරීම → 2. එම ලේඛන විදේශ කටයුතු අමාත්‍යංශයෙන් (Consular Division) සහතික කිරීම → 3. ලේඛන ශ්‍රී ලංකා කොරියානු තානාපති කාර්යාලය මගින් සහතික කිරීම → 4. EPS ආයතනය වෙත ලේඛන, අයදුම්පත සමග විද්‍යුත් තැපැල ඔස්සේ යොමු කිරීම.

වන බව කරුණාවෙන් සලකන්න.

③ දකුණු කොරියාවේ සේවය කොට පැමිණි දැනට ශ්‍රී ලංකාවේ සිටින අයකුගේ නියෝජිතයෙකු ඉල්ලුම් කරන්නේ නම්,

1. සම්පූර්ණ කරන ලද රක්ෂණ අයදුම්පතෙහි ස්කෑන් පිටපතක් (රක්ෂණ අයදුම්පත සහ එය පිරවිය යුතු ආකාරය දැක්වෙන ආදර්ශ අයදුම්පත මේ සමග අමුණා ඇත).
2. ගුවන් ගමන් බලපත්‍රයේ පළමු පිටුවෙහි ස්කෑන් පිටපතක් (ඡායාරූපය සහිතව)
3. රක්ෂණ හිමිකරු කොරියාවෙන් පිටවූ බවට වූ ගුවන් ගමන් බලපත්‍රයේ ආගමන විගමන මුද්‍රාව ස්කෑන් පිටපතක් (Departure Seal)
4. සේවකයා විසින් තමාගේ අත් අකුරින් ඉංග්‍රීසි භාෂාවෙන් ලියන ලද ඔහුගේ/ඇයගේ දුරකථන අංකය සහිත බලය පැවරූ ලිපියක ස්කෑන් පිටපතක්
5. නියෝජිතයාගේ ජාතික හැඳුනුම්පතෙහි ස්කෑන් පිටපත් (Scan ID)
6. අදාල සේවකයාගේ සක්‍රීය බැංකු ගිණුමක ස්කෑන් පිටපතක්

උක්ත ලියවිලි නීතිඥයකු ලවා සහතික කරවාගත යුතුය.

④ දකුණු කොරියාවේ සේවය කොට මියගිය අයකු වෙනුවෙන් පවුලේ සාමාජිකයෙකු ඉල්ලුම් කරන්නේ නම්,

A. සම්පූර්ණ කරන ලද රක්ෂණ අයදුම්පතෙහි ස්කෑන් පිටපතක් (රක්ෂණ අයදුම්පත සහ එය පිරවිය යුතු ආකාරය දැක්වෙන ආදර්ශ අයදුම්පත මේ සමග අමුණා ඇත).

B. මියගිය අය වෙනුවෙන් ඉදිරිපත් කළ යුතු ලේඛන

| | |
|---|---|
| 1. | මරණ සහතිකය |
| 2. | උප්පැන්න සහතිකය |
| 3. | ගුවන් ගමන් බලපත්‍ර ඡායා පිටපතක් (ඡායාරූපය සහිත පිටුව) |
| 4. | කොරියාවෙන් පිටවූ බවට වූ ආගමන විගමන මුද්‍රාව (Departure Seal) |
| 5. | ජාතික හැඳුනුම්පතෙහි ඉදිරිපස සහ පිටුපස ඡායා පිටපත් |

'B' කාණ්ඩයේ 1, 2, 5 අංක යටතේ ඇති ඉදිරිපත් කළ යුතු ලේඛන ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කර, අංක 3 සහ 4 හි දක්වා ඇති ලේඛන සමඟ අදාල සහතික කිරීම් සඳහා ඉදිරිපත් කළ යුතුය. සෑම විටම මුල් ලේඛන ඡායා පිටපත් සමඟ ඉදිරිපත් කළ යුතුය.

C. ඉල්ලුම්කරු විසින් ඉදිරිපත් කළ යුතු ලේඛන

| | |
|---|---|
| 1. | පවුලේ ඥාතීත්වය සනාථ කරන සහතිකයක් (උප්පැන්න සහතිකය/විවාහ සහතිකය) |
| 2. | සක්‍රීය බැංකු ගිණුමක ඡායා පිටපතක් ගිණුම් හිමියාගේ නම, අදාල බැංකුවේ Swift කේතය සමග |
| 3. | ජාතික හැඳුනුම්පතෙහි ඉදිරිපස සහ පිටුපස ඡායා පිටපත් |

'C' කාණ්ඩයේ අංක 1 යටතේ ඇති ඉදිරිපත් කළ යුතු ලේඛන ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කර, අංක 2 සහ 3 හි දක්වා ඇති ලේඛන සමඟ අදාළ සහතික කිරීම් සඳහා ඉදිරිපත් කළ යුතුය. සෑම විටම මුල් ලේඛන ඡායා පිටපත් සමඟ ඉදිරිපත් කළ යුතුය.

1. ඉහත කාණ්ඩ 2ටම අදාල (B සහ C) සියලු ලේඛන නීතිඥයකු ලවා සහතික කිරීම → 2. එම ලේඛන විදේශ කටයුතු අමාත්‍යංශයෙන් (Consular Division) සහතික කිරීම → 3. ලේඛන ශ්‍රී ලංකා කොරියානු තානාපති කාර්යාලය මගින් සහතික කිරීම → 4. EPS ආයතනය වෙත ලේඛන, අයදුම්පත සමඟ විද්‍යුත් තැපැල ඔස්සේ යොමු කිරීම.

බැංකු ගිණුමෙහි නම සටහන් විය යුතු ආකාරය




උදා: ගුවන් ගමන් බලපත්‍රයේ නම:

- වාසගම /SURNAME - THENNAKOON MUDIYANSELAGE AMBAGAHA GEDARA

වෙනත් නම් /OTHER NAMES - PRASAD PERERA

ගුවන් ගමන් බලපත්‍රයේ නම අනුව බැංකු පොතෙහි නම පහත සඳහන් ආකාර වලින් 1ක් විය යුතුය.

ආකාර 01. THENNAKOON MUDIYANSELAGE AMBAGAHA GEDARA PRASAD PERERA

ආකාර 02. T.M.A.G PRASAD PERERA

ආකාර 03. T.M.A.G. P. PERERA

✱ විදේශ අනන්‍යතා පත ඔබ සතුව පවතී නම් ලංකාවෙහි කොරියානු තානාපති කාර්යාලය වෙත එය ලබා දීමෙන් හෝ පහත ලිපිනය වෙත ලියාපදිංචි තැපෑලෙන් යොමු කිරීමෙන් පසු එය භාරදුන් බවට ඇති සහතිකය (ලියාපදිංචි තැපෑලෙන් යොමු කෙරේ නම් එහිදී ලබාදෙන ලදුපත) සමග ඔබගේ අයදුම්පත ඉහත සඳහන් උපදෙස් ප්‍රකාරව අපවෙත යොමු කරන්න.

*"Consular Section Officer,*
*Embassy of the Republic of Korea,*
*98, Srimath Anagarika Dharmapala Mawatha,*
*Colombo 7"*

ඉහත සඳහන් කර ඇති පරිදි ඔබ මේ වනවිටත් මෙම රක්ෂණ මුදල් ලබාගෙන හෝ රක්ෂණ මුදල් ලබාගැනීම සඳහා අයදුම්පත් යොමුකර ඇත්නම්, නැවත ගෙවීමක් හෝ අයදුම්පත් යොමුකිරීමක් සිදුකරනු නොලැබෙන බැවින් කිසිදු ආකාරයකින් අයදුම් කිරීමක් හෝ ඒ පිළිබඳව විමසීමක් සිදුකිරීමෙන් වළකින්න.

**Published by - ශ්‍රී ලංකා EPS මධ්‍යස්ථානය**
දුරකථන අංක - 0112886945
**(2023.01.17)**